**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக் குழு**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Commission to Investigate Allegations of Bribery or Corruption**

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of the standing order No. 119(4)

## රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාව සම්බන්ධව අපගේ නිරීක්ෂණ හා ගෙන ඇති පියවර

## 2020 වර්ෂය

**පාර්ලිමේන්තතු ප්‍රකාශන මාලා අංකය - 183**

**ආයතනයේ නම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය |
|---|---|
| ❖ සෑම වාහනයක් සඳහාම ලොග් සටහන් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාල කර නොතිබුණි. | විගණන දිනය වන විටත් සෑම වාහනයක් සඳහාම ලොග් පොත් සකස්කර තිබිනි. මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| ❖ 2016.12.29 දිනැති අංක 2016/30දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව විශේෂිත වියදම් ඒකකය සතු වාහන වල ඉන්ධන දහනයවීම පිළිඹඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | කොමිෂන් සභාවේ සෑම සංචිත වාහනයක් සඳහාම සම්පූර්ණයෙන් ඉන්ධන පිරවීමක් සිදුකර ධාවන සටහන් මගින් එය නිතිපතා පරීක්ෂා කරනු ලබයි. එහෙත් වර්තමානයෙ පවතින ඉන්ධන සීමා නිසා ඉන්ධන පරීක්ෂාව අපහසු වී ඇත. |
| ❖ මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි. | මෙම අත්තිකාරම් විමර්ශන හා වැටලීම් රාජකාරි සඳහා සහභාගී වන විමර්ශන නිලධාරීන්ට ආරක්ෂිත නවාතැන් වෙනුවෙන් ලබා දෙන අත්තිකාරම් වන අතර අදාල රාජකාරිය නිමවූ වහාම එම අත්තිකාරම් පියවීමට එම නිලධාරීන් අපොහොසත් වන්නේ නිලධාරීන් සංඛ්‍යාව සීමිත බැවින් ඔවුන් වහාම තවත් රාජකාරියකට අනුයුක්ත කරන බැවිනි. කෙසේ නමුත් ලබාගන්නා අත්තිකාරම් නොපමාව පියවීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. |
| ❖ 2002.09.12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්න්තුව වෙත ඉදිරිපත් කර නැත. | මෙම රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කාර්යසාධන වාර්තාව සමග විගණන වාර්තාවද ඉදිරිපත කළ යුතුය. කාර්ය සාධන වාර්තාව පළමු කාර්තුවේදීම ජනාධිපති කාර්යාලය වෙත යොමු කළ ද විගණකාධිපතිවරයාගේ විගණන වාර්තාව ප්‍රමාද වූ හෙයින් මෙම වාර්තාව යොමු කිරීම ප්‍රමාධ විය. රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය නිසා විගණන වාර්තාව ලැබීමේ ප්‍රමාධයක් සිදු විය. මෙම වර්ෂයේ මෙම වාර්තාව නියමිත දිනට පෙර යොමු කිරීමට කටයුතු යොදා ඇත. |

ඩබ්.කේ.ඩී. විජේරත්න
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක. 36, මලලසේකර මාවත, කොළඹ 07.